WWW.OLEVELAPI.COM



# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| I කොටස | - | 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ |
| II කොටස | - | 3 ප්‍රශ්නය අනිවාර්ය වේ |
| III කොටස | - | කැමති ප්‍රශ්න 02ක් පමණයි |

| | | | | |
|---|---|---|---|---|
| I කොටස | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | 2 ප්‍රශ්නයට | - | ලකුණු 25 |
| | | | | ලකුණු 45 |
| II කොටස | - | 3 ප්‍රශ්නයට | - | ලකුණු 25 |
| III කොටස | - | එක් ප්‍රශ්නයකට 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු | - | I කොටස | - | ලකුණු 45 |
| | | II කොටස | - | ලකුණු 25 |
| | | III කොටස | - | ලකුණු 30 |
| | | | | ලකුණු 100 |

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින්



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

WWW.OLEVELAPI.COM

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM


# 47- සිංහල සාහිත්‍ය රසාස්වාදය

## I කොටස

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "පිටිපස්සේ උන් ඇත්ගොව් ඉතාම චපලය, මට උසුළු විසුළු පෑයේ ය."
(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දේ ද?
(ආ) මෙහි ඇත්ගොව්වා ලෙස පෙනී සිටියේ කවරෙක් ද?

(අ) ප්‍රභාවතිය / පබාවතී / පබාවතී කුමරිය

(ආ) කුස රජු / කුස කුමාරයා

(ii)
**අමිත** ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහද
දිගත **පතළ** සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) "අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහද" යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(අ) අමිත - අප්‍රමාණ / පමණ කළ නොහැකි / මැනිය නොහැකි / කෙළවරක් නැති
පතළ - පැතිරුණු / පැතිරුණා වූ

(ආ) කෙළවරක් නැති හිරිහැරවලට පාත්‍ර වුව ද දුෂ්ට / නපුරු සිතක් ඇති කර නොගනිති.

(iii) "කටේ හැටි කිරි අප්පුගෙ හොඹු කට වගෙයි."
(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය අසා කෝප වන්නේ කවරෙක් ද?

(අ) වෙසක් පහන කෙටිකතාවේ කථකයා / බාල සහෝදරයා විසිනි.

(ආ) වෙසක් පහන කෙටිකතාවේ කථකයාගේ නැගණිය / නංගී / බාල සහෝදරිය විසිනි.

(iv) "මේ තෙමේ සන්තක වස්තුවට තමා ආවේණිකව හිමි හෙයින් ඉල්වයි."
(අ) මෙම ප්‍රකාශයේ 'මේ තෙමේ' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?
(ආ) මෙය කවුරුන් විසින් කරන ලද ප්‍රකාශයක් ද?

(අ) රාහුල කුමාරයා / රහල් කුමරු

(ආ) බුදුන් වහන්සේ විසින්

WWW.OLEVELAPI.COM

(v) "මුන්නැහේලා සෙල්ලක්කාර තරුණ මහත්තුරු"
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(අ) ඉයෝනා / ඉයෝනා පොටපොෆ් / ඉයෝනා නම් අශ්ව කරත්තකරු/
ඉයෝනා නම් අස් රියකරු විසිනි.

(ආ) ඇන්තන් චෙකොෆ් / ඇන්ටන් චෙකොෆ් / ඇන්තන් පවුලොවිච් චෙකොෆ්

*(ලකුණු 4 x 5 = 20යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**2.** පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගි කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබෙ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පෑයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්,
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු - වැව් පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්.
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්.

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෙ'ව පවතිත් නිතින්.

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(i) මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
(ii) මෙම පද්‍ය නිර්මාණයේ දී යොදා ගත් කාව්‍යෝක්ති
(iii) යොදා ගත් කාව්‍ය භාෂාව හා ආකෘතිය
(iv) වැහි වලා කුළෙන් ඇති ප්‍රයෝජන
(v) සොබාදහමේ සොඳුරු බව

(ලකුණු 25 යි.)

(i)

ස්වභාව ධර්මය පාදක කරගනිමින් කවියා මානව චර්යා පිළිබඳ හැඳින්වීමක් කිරීමට උත්සාහ ගෙන ඇත. මෙහි දී වැහි වලාකුළක් කවියාගේ අවධානයට යොමු වී ඇත. වැහි වලාකුළේ බාහිර ස්වරූපය ගැන කෙරෙන වර්ණනය මගින් ඔහු මානව චර්යා කිහිපයක් ද අවධාරණය කරයි.

- මිනිස් සමාජයේ ඇති යහපත අයහපත, උසස් - පහත් චරිත ස්වභාව මේ මගින් විවරණය කරයි.

උදා - "සිරුරු පෑයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා"
සුදු වලාකුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෝ'ව් පවතිත් නිතින්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

අදාළ නිදර්ශන දක්වමින් අදහස් දක්වා තිබිය යුතු ය.

*(ලකුණු 05 යි)*

(ii) කාව්‍යෝක්ති

මේ පිළිතුර සඳහා නිදර්ශන ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එහි දී කාව්‍යාලංකාරය සඳහා භාවිත වන උපමා රූපක ආදිය කවියා යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කිරීම සාර්ථක පිළිතුරක් සඳහා අවශ්‍ය වේ. ඒ සඳහා අදාළ කාව්‍යෝක්ති කිහිපයක් මෙසේ ය;

'' අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්
තුරුලියත් ලිය-ලයි සැනසී දියෙන්''
''සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි ; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෝ'ව් පවතිත් නිතින්.''
''විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්''

උපදේශ කාව්‍යවල එන සමාන වස්තු උපමා කිරීමේ කාව්‍යෝපක්‍රමය මෙහි යොදා ගෙන ඇත. (මෙය 'ප්‍රතිවස්තූපමා' නැමැති කාව්‍යාලංකාරයයි.)

*(ලකුණු 05 යි)*

(iii) හෙළ හවුල පිළිගත් වියත් භාෂා ව්‍යවහාරයක් භාවිත කරමින් නිර්මාණය වූ මෙම පද්‍ය පන්තිය සිලෝ විරිතෙන් ලියවී ඇත. මෙහි දී කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ''ඇ'' කාර භාවිතයයි. එසේ ම මෙම පද්‍ය පන්තියේ භාෂා ව්‍යවහාරය වියතුන්ගේ ඇගයීමට ලක්වූවකි.

- කවියා වැහි වලාකුළ අමතා කරන ප්‍රකාශයක් ලෙසින් පද්‍ය පන්තිය නිර්මාණය කර තිබීමෙන් නව්‍ය අත්දැකීමක් කාව්‍යාත්මක ව ඉදිරිපත් කරයි.

උදා - "ලොවට දෙන්නා ඔබයි අහරත් පැනුත් "
"නද අසා ඔබ ගේ පැහැයත් බලා"
"ගුණ බලා ඔබ ගේ ලෝ සබා දහම්"
වැනි යෙදුම් නිදසුන් ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- නිරායාසයෙන් ගලා යන ගීතවත් බස් වහරක් යොදා ගෙන තිබේ.

  උදා - "පැනැ නැඟී අහසේ පැතිරී ගොසින්
  මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
  "නද අසා ඔබගේ පැහැයත් බලා
  මොනරු පිල් විදහා රඟ දෙත් නදින්

- වැහි වලාකුළට සජීවී ගුණයක් ආරෝපණය කරමින් එය පුද්ගලයකු නොහොත් ජීවියකු ලෙස සලකා ආමන්ත්‍රණය කරයි.

  උදා - "ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත් "
  "නද අසා ඔබ ගේ පැහැයත් බලා"
  වැනි යෙදුම් නිදසුන් ය.

- කාව්‍ය නිර්මාණයේ දී ව්‍යාකරණ රීති අනුව ම යමින් කාව්‍ය නිර්මාණයට එළඹි කවියා සන්ධි පද භාවිතයට ද වැඩි කැමැත්තක් දක්වා ඇත.

  උදා : නැමුණු + එව් = නැමුණේ'ව්
  ඔබ + හැර = ඔබැ'ර

- අනුප්‍රාසවත් පද භාවිත කර ඇත.

  උදා : කිසිලෙස්, නොසතොස්

පූර්වෝක්ත කරුණු සමස්තයක් ලෙස පිළිතුරට ඇතුළත් වී ඇත්නම් එය සාර්ථක පිළිතුරක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න.

***(ලකුණු 05 යි)***

(iv) වැහි වලාකුළෙන් ඇති ප්‍රයෝජන

- ගිමන සන්සිඳුවීම

  උදා - "මහ ගිමන් සිඳුවා සත සිත් තොසින් "

- වැව් පොකුණු දියෙන් පිරවීම

  උදා - "කුඹුරු- වැව් පොකුණුත් පුරවා දියෙන්,
  ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්."

- පරිසරය ප්‍රාණවත් කිරීම

  උදා - "අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
  තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්."

පද්‍ය පන්තියෙන් දැක්වෙන වැහි වලාකුළෙහි ප්‍රයෝජන කවරේදැයි පැහැදිලි ව දක්වා අවශ්‍ය නිදර්ශන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

***(ලකුණු 05 යි)***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(v) සොබාදහමේ සොඳුරු බව

- වර්ෂාව ලැබීමෙන් පරිසරය ප්‍රබෝධවත් වී සුන්දර වන ආකාරය කවියා නිරූපණය කර තිබේ.

උදා - "මහ ගිමන් සිඳුවා සත සිත් තොසින් "
"නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්."
"අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන් ''

පූර්වෝක්ත අවස්ථා විස්තරාත්මක ව දැක්වීම අවශ්‍ය වේ.

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 25 යි)*

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

**3.** "තව ද ප්‍රභාවතීනි කුසරජ්ජුරුවන්ගේ යම් ගෘහෝද්‍යාන විද්‍යුල්ලතා සශ්‍රීක ව විරාජමාන වූ ස්වර්ණ මයූර රාජයන් විසින් මිහිගු බෙර හඬින් මත් ව පවත්වන ලද කේකානාදයෝ ද කොස්ලිහිණියන් විසින් පවත්වන ලද අනුරාගයෙන් හරිත වේ ද, එබඳු වූ ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්වර්ය විශේෂ ඇති ඒ කුසාවතී රාජධානියෙහි ඉසුරු හැර ඊට වඩා කවර සැපයෙක් කොයි ඇති හෙයින් මීට අවුද" යනාදීන් ප්‍රභාවතීන්ට අවවාද වශයෙන් කුසාවතියෙහි විභූතිය වර්ණනා කොට ඉදින් ඒ කුස රජ්ජුරුවෝ අද මෙතන වී නම් මේ සත්රජදරුවන් මරා ලුහුබඳවා මාගේ දියණියන්ට පැමිණි මේ දුක් දුරුකොට කැඳවා ගෙන යන්නෝ වේ ද, කපුටු රැසක් කැටක් ගසා පලවා ලන්නාක් මෙන් තමන්ගේ වචන මාත්‍රයකින් ම සකල ශත්‍රු මර්දනය කරන්නා වූ ඉදින් සිතුව හොත් එක් සියක් රාජධානීහුත් හැර ගන්ට නිසි වූ සමර්ථ ඇති විශිෂ්ට වූ ප්‍රඥානුභාව ඇති ඒ කුස රජ්ජුරුවෝ අද මෙනුවර වූ නම් අප හැමට පැමිණි මේ දුකින් ගලවා ගන්නාහු යයි යනාදීන් කුස රජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහු ය.

එකල්හි ප්‍රභාවතී තොමෝ "කුස රජ්ජුරුවන්ගේ ගුණ කියන්නා වූ මාගේ මෑණියන් වහන්සේගේ මුඛ නො සෑහෙන්නේ ය. එහෙයින් උන් වහන්සේ අරක්කැමි කොට මේ ගම වසන බව මෑණියන් වහන්සේට කියමි"යි සිතා "මෑණියන් වහන්ස, අනන්‍ය සාධාරණගුණගණාභරණවිභූෂිත ශෞර්‍යවීර්යබලපරාක්‍රමප්‍රතාපප්‍රඥාගුණ ඇති මේ සතුරන් නසා අප හැම රකින්ට නිසි වූ කුසරජ්ජුරුවන් වහන්සේ අපට ආලාරිකව මෙතන ම වාසය කරන සේක. උන් වහන්සේ කැඳවම්දැ"යි විචාළා ය.

ඉක්බිති "ප්‍රභාවතීනි, මරණභයින් පීඩිත ව නන්දොඩ වූ ද, අඥානයෙන් මූඪ වූ ප්‍රලාප දොඩවූ ද, බොලඳකමින් කිව මනා දෙය තබා අනිකක් කියවූ ද තොප මේ කියන්නේ කිම් ද ඒ කුස රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවු නම් අපට නො දැනෙන්ට කාරණා කිම් ද ඉදින් එත් නම් අපට කියා එවා තමන්ගේ සේනාවාහනයන් පිරිවරා නෙත් ද, මැගේ කුමන නන් දෙඩීමෙක් ද" යනාදීන් දෙඩූ ය.

එසඳ ප්‍රභාවතී මෑණියන් වහන්සේ කුමක් කීවත් අදහා නො ගන්නා සේක. ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමි සිතා මෑණියන්ගේ අත අල්වාගෙන මතු මාල්තලයට නැඟී ගොස් සීමැදුරු කවුළුව හැර පිටත බලා වළන් සෝධමින් සිටි බෝධිසත්ත්වයන් දිසාවට අත දිගු කොට "මෑණියන් වහන්ස, තෙලෙ කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසන්නයෙහි මුළුතැන්ගෙයි මිදුලෙහි තරයේ කැසපට ගන්වා අරක්කැමි වේශයෙන් නැඹුරුව සිට වළන් සෝධන සේක් කුස රජ්ජුරුවන් වහන්සේ" යයි ඇත් වූ ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

එකල බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් නිසා සත්රජ්ජුරු කෙනෙක් මෙ නුවර වටලා ගත්තාහ යි යනු අසා අද දවස් මාගේ මනෝරථය මුදුන් පැමිණෙන්නේ යයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමවුපියන්ට කියන්නී ය. ඒ අසා මා ගෙන්වා ගෙන උන් මට පාවා දෙති. එකල මා ගත් දුක් සාර්ථක වන්නේ යයි වළන් සෝධා තැන්පත් කොට තබමි සිතා පැන් ගෙනවුත් වළන් සෝධන්ට පටන්ගත්හ. එසඳ වළන් සෝධමින් සිටි රජ්ජුරුවන් දැක දියණියන්ට උරණව "කෙල්ල, තෝ චණ්ඩාල එකක් ද, අවශේෂ හීන ජාතියෙහි එකක් ද නොහොත් මෙබඳු රාජ වංශය නසන්ට උපන් එකක් ද මදු රජ කුලයෙහි උපන් තෝ සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබළන ලද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජනු ලවා දාස ක්‍රියා කරවි දැ"යි පරිභව බිණූ ය.

(i) කුස රජතුමා සාගල පුරයට පැමිණ සිටි බව පබාවතියගේ මව දැන සිටියේ යැයි පූර්වෝක්ත ඡේදයෙන් කියැවේ ද?

නැත. / දැන සිටි බව ඡේදයෙන් නොකිය වේ.

*(ලකුණු 05 යි)*

(ii) දඹදිව සියලු රජ දරුවන් කුස රජතුමාගේ දෙපා වන්දනය කළ බව කියැවෙන අවස්ථාව ඡේදයෙන් උපුටා දක්වන්න.

''සකල රාජ මෞලි මාණික්‍යකාන්තීන් බබළන ලද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජනු''

*(ලකුණු 05 යි)*

(iii) තම අභිමතාර්ථය සාධනය වන බව කුස රජු දැන ගත්තේ කෙසේ ද?

රජවරුන් සත්දෙනෙකු පබාවතිය ලබා ගැනීම වෙනුවෙන් සාගල නුවර වටලා ගත් අවස්ථාවේ ඔවුන්ගෙන් ගැලවීම සඳහා තමාගේ පිහිට පැතීමට මදු රජුට සිදුවන බව කුස රජු අවබෝධ කර ගත්තේ ය. එමගින් තම අභිමතාර්ථය; එනම් පබාවතිය නැවත දිනා ගැනීම සාර්ථක වන බව කුස රජු දැනගත්තේ ය.

*(ලකුණු 05 යි)*

(iv) කුස රජතුමාගේ බලපරාක්‍රමය වර්ණනා කර ඇති ආකාරය මෙම ඡේදය ඇසුරෙන් පැහැදිලි කරන්න.

- කුස රජුගේ බලපරාක්‍රමය දැක්වීම සඳහා පබාවතීගේ මෑණියන් විසින් කුසාවතී පුරයෙහි ශ්‍රී සෞභාග්‍යය සහ ඓශ්වර්ය පිළිබඳ කෙරෙන වර්ණනය
- කුස රජුට, සත්රජ දරුවන් පළවා හැරීම, කපුටු රැසක් කැටක් ගසා පන්නා දැමීම වැනි පහසු කටයුත්තක් බව සඳහන් කිරීම
- පබාවතිය, සිය මෑණියන්ට කුස රජතුමා තම මාළිගයේ වාසය කරන බව දැන්වීමේ දී රජතුමා පිළිබඳ කරන වර්ණනය
- දඹදිව සියලු රජුන් කුස රජුගේ පාද වන්දනයේ යෙදෙන බවට පබාවතියගේ මෑණියන් විසින් කරනු ලබන වර්ණනය

සාර්ථක පිළිතුරකට අදාළ කොටස් උපුටා දක්වා තිබීම අවශ්‍ය වේ.

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 25 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**නැතහොත්**

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නගියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම ද මිනිසා සතු දෙ නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දී එකට හමු වන දූර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

(i) මෙම පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද?

- සිංහල සහ දෙමළ ජනතාව අතර අනවබෝධය නිසා ඇති වන දූරස්ථභාවය පිළිබඳ කවියා බලවත් පසුතැවිල්ලට පත් ව ඇත.
- පරිසරය හා සමාජ ජීවිතය සලකා බලන විට ඇත්තේ බෙහෙවින් සමානතා ය.
- සියලු ආකාරයෙන් සම වූ ජාතීන් දෙක අතර ඇති මේ දූරස්ථභාවය සමාජ ප්‍රගතියට අයහපත් ලෙසින් බලපාන බැවින් එම දුර්වලතා මගහරවා ගැනීම සඳහා කවියා තම නිර්මාණය යොදා ගැනීමට උත්සාහ දරයි.

පූර්වෝක්ත කරුණු ආශ්‍රයෙන් අදාළ පිළිතුර සපයා තිබීම අවශ්‍ය වේ.

*(ලකුණු 05 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ii) තම අත්දැකීම ප්‍රබලව ඉදිරිපත් කිරීමේ දී පරිසර වර්ණනා යොදාගත් ආකාරය පහදන්න.

කවියා බලාපොරොත්තු වන්නේ වර්තමානයේ අනවබෝධය නිසා ඇතිවන අසමගිකම් දුරු වී ජාතීන් අතර සමගිය වර්ධනය වීම ය. ඒ සඳහා කවියා මේ ප්‍රදේශ දෙකෙහි ඇති සමාන අසමානකම් දැක්වීමට පරිසර වර්ණනා යොදා ගනියි. හිරු උදාවීම, සඳ හා තරු පායා ඒම, මදනල හැමීම ආදි සොබා දහමේ සිදුවීම් මෙහි දී යොදා ගෙන ඇත.

උදා : ''රන්තරු රිදී තරු සවසට පෙළට ඇදේ''

''හඳ ඇති දාට රසබර රැස් දහර හදේ''

''පොල්ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ''

''ගෙන එයි මිහිරි ගී මද නල හමන විට''

''උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට''

යනාදි ලෙසින් පරිසර වර්ණනා යොදා ගෙන ඇති අයුරු දැක්විය යුතු ය.

*(ලකුණු 05 යි)*

(iii) උතුරෙත් දකුණෙත් දැකිය හැකි පොදු සමානතා මොනවා ද?

සොබා දහමේ සිදුවීම් උතුරට හා දකුණට වශයෙන් වෙනසක් නොවීම

''දකුණේ මෙන්ම උතුරෙත් හිරු නැගියි උදේ
රන්තරු රිදී තරු සවසට පෙළට ඇදේ''

- ''ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැන ම සිටී''

උතුරේ මෙන් ම දකුණෙත් එකසේ දුක් විඳින මිනිසුන් සිටීම. ඒ හැම දෙනාගේ ම සිත් තුළ අනුකම්පාව, සංවේදීබව පැවතීම පොදු ලක්ෂණයකි.

*(ලකුණු 05 යි)*

(iv) "මෙම පද්‍ය පන්තියෙන් කවියා විසින් අපේක්ෂා කරන ලද්දේ ජාතික සමගියයි" විමසන්න.

සිංහල හා දෙමළ ජනතාව අතර ජාතික සමගියේ අවශ්‍යතාව අවධාරණය කරන කවියා ඒ සඳහා පරිසරයේ හා මානව වර්ගයාගේ සමානතා උපුටා දක්වමින් තම අත්දැකීම ඉදිරිපත් කරයි. සියලු ජාතීන්ට පායන්නේ එක ම හිරු හා සඳු ය. හමා යන්නේ එක ම සුළඟ ය.

WWW.OLEVELAPI.COM

මානව චර්යා දෙස බලන විට දමිළ ජනයාගේ දයාන්විත බව, අනුන් උදෙසා ඔවුන්ගේ නෙත් තෙත් වන බව ජාතික සමගියට වූ මනා එළඹුමක් බව අවධාරණය කරයි.

උතුරේත් දකුණේත් සාමාන්‍ය ජනයා එනම් ශ්‍රමය වැයකරන කම්කරු ආදීන්ගේ ළතෙත් බව හා පොදුවේ ඔවුන් විඳින ගැහැට දුරු කිරීමේ මග වන්නේ ද ජාතික සමගිය බව කවියා අදහස් කරයි.

උතුර හා දකුණ අතර ඇති භේදය බිඳ දැමීම සඳහා ජනතා බලවේගයක් ඇති විය යුතු බවට කෙරෙන අවධානය කවියාගේ අපේක්ෂාව පැහැදිලි කරයි.

මේ සඳහා අවශ්‍ය නිදර්ශන පද්‍ය පන්තිය ඇසුරෙන් දක්වා තිබීම අවශ්‍ය වේ.

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 25 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

## III කොටස

මෙම කොටසෙන් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.
(පිළිතුර වචන **150ට නො අඩු** විය යුතු ය.)

**4.** "බුදුන් වහන්සේ තම ඥාතීන් කෙරෙහි දැක්වූ මහා කරුණාව නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුවෙන් මනාව ප්‍රකට වේ." පැහැදිලි කරන්න.

නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුවේ දී බුදුන් වහන්සේ ස්වකීය ඥාතීන් වෙත දැක් වූ මහා කරුණාව පහත සඳහන් අවස්ථා මගින් මැනවින් නිරූපණය කර ඇත.

- කිඹුල්වත් පුරයට වැඩමකර පිය රජුට දහම් දෙසා සෝවාන් ඵලයට පැමිණ වීම
- සුළු මව වූ ප්‍රජාපතී ගෝතමියට දහම් දෙසා ඇය ද සෝවාන් කරවීම
- පසුව පිය රජතුමා සකෘදාගාමී කරවීම
- යශෝදරා දේවියට චන්දකින්නර ජාතකය දේශනා කිරීමෙන් ඇයගේ චිත්ත සන්තාපය දුරු කරවීම
- නන්ද කුමරු මහණ කරවා නිවන් මගට පැමිණවීම
- රාහුල කුමාරයා පැවිදි කරවීම

මෙම සිද්ධි ඇසුරින් පිළිතුර තහවුරු කළ යුතු ය.

*(ලකුණු 15 යි)*

**5.** සමකාලීන සමාජ අසාධාරණය මැනවින් නිරූපණය කිරීමට 'වැලපීම' කෙටිකතාවේ කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය අගයන්න.

සමකාලීන සමාජ අසාධාරණය 'වැලපීම' කෙටි කතාවේ කතුවරයා විවිධ අංශ ඔස්සේ විවරණය කරයි.

- දිළිඳුකම නිසා ඉයෝනා නම් කරත්තකරු අසරණ වී ඇති ආකාරය නිරූපණය කරයි.
  - ''තනි සුදු පැහැය ගෙන සිටි ඉයෝනා පොටපොෆ් නම් රියකරු අවතාරයක් මෙන් පෙනෙයි...''
  - ''තනි සුදු පැහැති ඔහුගේ අශ්වයා ද නොසෙල්වෙයි. උගේ නිසොල්මන් ගතියක් කෙට්වූ සිරුරත් ...''
  - ''මගේ පුතා මැරුණා. මම තාම පණපිටින් ....එහෙම පුදුම දෙයක්. මරුවට පාර වැදුණා''
- ධනවතුන්ගෙන් දුප්පතුන්ට පීඩා හා පරිභව සිදු වන ආකාරය පෙන්වා දෙයි.
  - ''කොහෙද යකෝ යන්නේ? ද-කු-ණ-ට උඹ දක්කන්න දන්නේ නෑ...''
  - ''නාකි රාළ උඹේ තොප්පියේ හැටි...''
  - '' උඹේ බෙල්ල කඩනවා ...''
- ශ්‍රමය සූරා කෑම හා ධනය බෙදී යාමේ විසමතාව මැනවින් නිරූපිත ය.
  - ''අපි තුන්දෙනාට ම ග්‍රිවෙනික් දෙකක් දෙන්නම් !''
  - ''එතෙක් මෙතෙක් ඔවුන්ට එක ම කුලියකුදු නොලැබිණ.''
  - ''මට තාම කඩල මිලවත් හොයා ගන්න බැරි වුණා.''
  - ''මිනිහෙකුට තමන්ගේ රක්සාව හොඳට කරන්න පුළුවන් නම් නිදහසේ නිදන්නට පුළුවනි.''

*(ලකුණු 15 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

6. "ශ්‍රී ලාංකේය ගැමි ජනතාවගේ ජීවන රටාව අව්‍යාජ විලාසයෙන් ඉදිරිපත් කිරීම තුංමංහංදිය නවකථාවේ වස්තු විෂය යි." විමර්ශනය කරන්න.

ශ්‍රී ලාංකේය ගැමි ජනතාවගේ දිවිපෙවත, තුංමංහංදිය නවකථාවේ විවිධ සිද්ධි හා අවස්ථා ඇසුරෙන් අව්‍යාජ ලෙස නිරූපණය කර ඇත.

- ගැමි දරුවන් නිදහස් හා කෙළිලොල් ජීවිතයක් ගත කළ බව නවකථාවේ නිරූපිත ය.

  උදා : පාසල ඇරෙන්නට සීනුව නාද වීමත් සමග දරුවන් හැසිරෙන ආකාරය සිරිසේනගේ සිතුවිලි කථනය මගින් ප්‍රකාශ කර ඇත.

  ''ඒ හදිස්සිය ගෙදර ඒමට නැත. කෑමට බොහෝ දේවල් මග දිගට තිබේ. දං, කැකිල්ල, බිම්පොල්, කටු අන්නාසි, අතට හසුවන මොනවා නමුත් කෑමට පුළුවන...

- දරුවන් නිදහසේ ක්‍රීඩා කරන අවස්ථා අව්‍යාජ ලෙස නිරූපිත ය.

  උදා : ''කොල්ලෝ ගල් අමුණට නැඟී කරණම් ගසමින් දියට පනිති, දිය යටින් පීනා ගොස් ඈතින් මතුවෙති... ''

- වැඩිහිටියන් දරුවන්ට නිදහසේ පරිසරය වින්දනය කිරීමට අවස්ථා උදාකර ඇති ආකාරය නිරූපණය කර ඇත්තේ අව්‍යාජ ලෙසිනි.

  උදා : '' නාගෙන නියර දිගේ එන විට පාට පාට කුරුලු පිහාටු නියර උඩ වැටී තිබේ. මම නැවතී ඒවා අහුලමි ...''

  '' තාත්තා වක්කඩ ළඟ ඇණ තියාගෙන ඉඳගෙන ලියැද්දට වතුර හරවමින් සිටියි. මම තණ පතක් කඩා එතන දිය සුළියට දමමි...''

- අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුක්ත ව ගැමියන් ස්වකීය අවශ්‍යතා ඉටුකර ගන්නා ආකාරය අව්‍යාජත්වයෙන් යුතු ව චිත්‍රණය කර ඇත.

  උදා :

  - පන්සලේ පිංකම් පැවැත්වීම
  - මංගල්‍යය අවස්ථාවන්හි කටයුතු කිරීම
  - ගොවිතැන් කටයුතුවල දී සහයෝගයෙන් වැඩ කිරීම

  වැනි අවස්ථා උදාහරණ ලෙස ඉදිපත් කර තිබිය යුතු ය.

- ගැමියන්ගේ සිරිත් විරිත් ඇදහිලි හා විශ්වාස ඉදිරිපත් කර ඇත්තේ අව්‍යාජත්වයෙනි.

  උදා :

  - ''ජුවානිස් ආතාගෙන් මට කටවහ වදී යැයි අම්මාට බය සිතේ'' වැනි ප්‍රකාශවලින් සාම්ප්‍රදායික විශ්වාසය නිරූපණය කර තිබේ.
  - මංගල චාරිත්‍ර චාරිත්‍ර විචිත්‍ර ලෙස විස්තර කර ඇත.
  - බලියාග පැවැත්වීම වැනි ගැමියන්ට ආවේණික සිරිත් විරිත් හා පුදපූජා තුංමංහංදිය නවකථාවේ ඇතුළත් වේ.

- කිසිදු ලාභ අපේක්ෂාවකින් තොර ව අනෙකා වෙනුවෙන් කැපවීම වැනි ගැමි ජීවිතයට ආවේණික මානුෂික ගුණාංග නිරූපණය කර තිබේ.

  උදා :

  - ''මඟුල් අවමඟුල් ආදියේ දී කරදෙන සැරසිලි වැඩවලට මාමා මුදල් නොගනියි. එය ඔහුගේ ප්‍රතිපත්තියකි. එපමණක් නොව කාගේ හෝ මඟුලක්, මරණයක්, ලෙඩක්,



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

දුකක් තිබෙන විට කිව්වත් නොකිව්වත් මාමා එහි ගොස් මැරීගෙන උදව් කරයි....''

වැනි අවස්ථා උදාහරණ ලෙස දැක්විය යුතු ය.

- ගැමියන්ගේ දුර්ගුණ වුව ද අව්‍යාජත්වයෙන් නිරූපණය කර ඇත.

උදා :

- මත්ද්‍රව්‍ය භාවිතය
- සූදුවට ඇබ්බැහි වීම

'' මාමා බීමටත් සූදුවටත් වැටුණේ නොදැනුවත්ව ම හෙමින් හෙමින් ය. දැන් ඔහු ඒවාට කොයිතරම් ඇබ්බැහි වී ඇද්ද කියතොත් බීමත් සූදුවත් දෙක මාමාට අයිති ඔහුගේ ආවේණික ලක්ෂණ හැටියට සැලකීමට කවුරුත් පුරුදු වී සිටිති.''

''බීගත් කල මාමාට පරණ කෝන්තර මතක් වෙයි. මිනිසුන් සමග ගහ බැන ගන්නට යයි''.....

ආදි අවස්ථා උදාහරණ ලෙස දැක්විය යුතු ය.

***(ලකුණු 15 යි)***

**7.** "සිරි ගුනසිංහ විසින් රචිත 'උදය' පද්‍ය පන්තිය සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැර වූවකි." විමසන්න.

සිරි ගුනසිංහ කවියා සාම්ප්‍රදායික කාව්‍ය රීතියෙන් මිදී ආකෘතිය මෙන් ම අන්තර්ගතය අතින් ද වෙනස් වූ අත්දැකීමක් ''උදය'' පද්‍ය පන්තිය මගින් ඉදිරිපත් කරයි. සෞන්දර්ය ලෙසින් පිළිගත් සංකල්ප කවියා දකින්නේ අසුන්දර වූ අත්දැකීමක් ලෙසින් ය. රාත්‍රී නිදිවැරීමෙන් හෝ වෙනත් හේතුවක් නිසා හෝ කවියා උදෑසන අවදි වීමට අකමැත්තක් දක්වයි. ඔහුට තවදුරටත් නිදා ගැනීමට අවශ්‍ය වේ. එම අත්දැකීම ඔහු පද්‍යයට නංවන්නේ අපූර්වත්වයෙන් යුතුව ය.

- කවියා සාම්ප්‍රදායික සඳැස් කාව්‍ය ආකෘතියෙන් බැහැර වී ඇත.

  උදා : '' පෙරදිග ගොරහැඩි රකුසෝ ''

  මගේ ධ්‍යානය ඇයි කඩන්නේ...''

  වැනි සුදුසු පද්‍ය කොටස් නිදසුන් ලෙස දැක්විය යුතු ය.

- රාත්‍රිය ගෙවී උදෑසන උදාවීම යන ස්වාභාවික සංසිද්ධිය දෙස වෙනස් දෘෂ්ටියකින් බලා ඇත.

  උදා :

  - ඉර උදාවීම, කථකයාගේ ධ්‍යානය බිඳීමක් ලෙස දැකීම
  - අඳුර දුරු වී ආලෝකය උදාවීම, නිදා ගැනීම සඳහා පොරවා ගත් කළු රෙදිපට ඉරා දැමීමක් ලෙස දැකීම

- උදෑසන පරිසරයේ පවත්නා සෞන්දර්ය ඇගයීම වෙනුවට උදෑසන අසුන්දර, කරදරකාරී සංසිද්ධියක් ලෙස දක්වයි.

  උදා : '' මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ...''

  '' කුරුල්ලන්ට ගල් ගහලා ...''

  ''මල් පොහොට්ටු තිගැස්සිලා කඳුළු සලනවා ...''

  කුරුලු ගීත, මල් පිබිදීම කවියා දකින්නේ හිරු විසින් කරන ලද පීඩා ලෙසිනි.

  මෙවැනි නිදසුන් ඇසුරෙන් පිළිතුර තහවුරු කළ යුතු ය.

***(ලකුණු 15 යි)***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....